**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය -2015**

**-------------------------------------------------**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1979 දෙසැම්බර් 26 දිනැති අංක 68/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

-----------------------------------------------

අස්තිත්වයන් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, ඊට පටහැනි ලෙස 2014 වර්ෂයේ විගණිත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිළිවෙලින් රු.24,723,016 ක් වූ සහ රු. 21,816,514 ක් වූ ගැලපීම්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සංශෝධනය කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

----------------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.42,134,565 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 06 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ දී රු. 682,359 ක් පර්යේෂණ දීමනා ලෙස ගෙවීම් කර තිබුණ ද පර්යේෂණ යෝජනාවලට අනුමැතිය හා ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ශිෂ්‍යයින් 67 දෙනෙකුගේ විද්‍යාගාර හා පුස්තකාල තැන්පතු එකතුව රු.241,510 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 156 | 1987, 1995, 2004 හා 2014 වර්ෂවලදී පුස්තකාල පොත් සමීක්ෂණයේදී හඳුනාගත් පරිදි පොත් 11624 ක් අස්ථාන ගත වීම නිසා ආයතනයට සිදු වූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.17,805,918 ක බාහිර දේශන ගාස්තුවලින් රු.1,780,591 ක් ගාස්තුව ගෙවන අවස්ථාවේදී අවකරණය කරගෙන විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය | මානව සම්පත් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,077,925 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,415,823 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,662,102 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වියදම රු.6,883,444 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු.8,545,547 කින් වැඩිවීම, ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇති වී තිබූ අතර, සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු.58,259,174 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී රු.113,171,141 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1979 අංක 9 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

- පශ්චාත් උපාධි පාඨමාලාවන්හී ඉහළ අධ්‍යයන ප්‍රමිතීන් සපුරා ගැනීම හා පවත්වාගෙන යාම.
- පශ්චාත් උපාධිධාරීන් අතර උසස් වෘත්තීය හා නායකත්ව ගුණාංග ඇති කිරීම.
- පශ්චාත් උපාධිධාරීන් තුළ ඉහළ ආචාර ධර්ම හා සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීම.
- සීඝ්‍රයෙන් වෙනස් වන ගෝලීය සංවර්ධනයට අනුවර්තනය විය හැකි පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම.
- ඉහළ ප්‍රමිතීන්හි මූලික හා ව්‍යවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ශිෂ්‍යයන් අතර නවෝත්පාදන පර්යේෂණ සඳහා ශක්‍යතාවය ගොඩනැගීම.
- අධ්‍යයන වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම සඳහා දක්ෂ හා කැපවුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සහ කාර්යක්ෂමව පරිපාලන, තාක්ෂණික හා සහායක කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීම.
- දැනුම ව්‍යාප්තිය
- ප්‍රධාන කෘෂිකර්ම තොරතුරු සම්පත් සහිත පුස්තකාලය බවට පත්කිරීම සඳහා පුස්තකාලය වැඩිදියුණු කිරීම.
- ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම.
- ආසියානු කලාපයේ හා ඉන් ඔබ්බට පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම.

(ආ) කාර්යසාධන තොරතුරු අනුව කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති උපාධිය හා ආචාර්ය උපාධිය සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2014 හා 2015 වර්ෂවල ශිෂ්‍ය ලියාපදිංචියේ අඩුවීම පිළිවෙලින් සියයට 27 ක් හා සියයට 62 ක් විය.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ තීරණ අංක 433.3.3.10 අනුව විශ්‍රාමික නිලධාරියෙකු උපරිම මාස 12 ක කාලයක් කාර්ය පැවරීමේ පදනම මත සේවයේ යෙදවිය හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි මාස 18 ක කාලයක් සේවයේ යොදවා වැඩිපුර මාස 06 කාලයක් සඳහා රු.300,000 ක වැටුප් ගෙවා තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ "සීමිත අරමුදල්" යටතේ දක්වා ඇති පර්යේෂණ ආධාර ව්‍යාපෘති ගිණුම් 03 ක රු.832,678 ක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ආයතනයේ අරමුණු හා පරමාර්ථ ළඟාකරගැනීම සඳහා ආයතනයේ අතිරික්ත අරමුදල් යොදාගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ පොදු අරමුදලින් හා පර්යේෂණ අරමුදලින් පිළිවෙලින් රු.289,428,611 ක් හා රු.11,016,356 ක් කාලීන සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවති මහාචාර්ය තනතුරු 06 ක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 04 ක් සඳහා ස්ථිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර සියලුම ඉගැන්වීම් කටයුතු බාහිර කථිකාචාර්යවරුන් 162 ක් යොදාගෙන සිදු කිරීම හේතුවෙන් දේශන ගාස්තුව ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.21,115,750 ක් ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති 2014 නොවැම්බර් 15 දින විශ්‍රාම ගොස් ඇතත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් එම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කළයුතු වුවත්, එම වාර්තා අදාල ඉලක්ක දිනයන්හිදී විගණන කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව විසින් තම නිරීක්ෂණ, නිර්දේශ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමක් කර නොතිබූ අතර, විගණන කමිටුව විසින් ඉටු කළ යුතු පහත සඳහන් කරුණු ඉටු කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුළත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම.

(ආ) රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මහපෙන්වීම් පිළිබඳ සමාලෝචනය.

(ඇ) අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනය හා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර නොතිබුණු අතර, ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 ක් නොඉක්මවන කාලය අතරතුර ක්‍රමවත්ව යාවත්කාලීන කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

----------------------------------

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විෂයයන් 56 ක සියයට 6 සිට සියයට 100 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අරමුදල් උපයෝජනය | අදාළ අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි ප්‍රදාන උපයෝජනය කර නොතිබීම. |
| (ආ) | පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම | මුදල් රෙගුලාසි සහ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |